# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
**P.O.Box 419, No. 330, Union Place, Colombo 02**

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.04. 28

**චක්‍රලේඛ - බැ/නි/ඒ/2023/03**

සියළුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ

සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**මූල්‍ය සේවා සමුපකාර සමිති සහ සංගම් විසින් ආයෝජන බැංකුකරුවන් (Investment Bankers) විසින් නිකුත් කරන භාර ලියවිලි (Trust Document) මත විවිධ මූල්‍ය සමාගම්වල ස්ථාවර තැන්පතු, වාණිජ පත්‍ර සහ වෙනත් මූල්‍ය උපකරණ වල ආයෝජනයන් කිරීම.**

**01. හැඳින්වීම**

මෙම චක්‍රලේඛයේ අරමුණ වන්නේ මූල්‍ය සේවා සමුපකාර සමිති සහ සංගම් විසින් විවිධ ආයෝජන බැංකුකරුවන් විසින් නිකුත්කරන භාර ලියවිලි මත සිදුකරන ආයෝජනයන්හි අවදානම් පැහැදිලි කර,එම ආයෝජනයන් සිදු නොකල යුතු බවට උපදෙස් නිකුත් කිරීම වේ.

**02. භාර ලියවිලි මත සිදුකරන ආයෝජනයන්ගේ අවදානම**

I. මූල්‍ය සේවා සමුපකාර සමිති විසින් ආයෝජන බැංකුකරුවන් නිකුත් කරන භාර ලියවිල්ලි මත මූල්‍ය සමාගම්වල සිදුකරන ආයෝජනයක් කල්පිරීමේදී එහි පොළිය සහ මුල් මුදල අදාල මූල්‍යායතනය විසින් නොගෙවුවහොත් එම අවදානම අදාල සමුපකාර සමිති/ සංගම් විසින්ම දරාගත යුතු බවත්, කිසිදු විටෙක භාර ලිපිය නිකුත් කරන ආයෝජන බැංකුකරු විසින් එම මුදල් නොගෙවන බවත් ආයෝජන බැංකුකරුවන් විසින් අපවෙත තහවුරු කර ඇත.

II. තවද, භාර ලියවිලි නිකුත් කරන ආයෝජන බැංකුකරුවන් විසින් “It is the responsibility of the Cooperative societies to evaluate the risk and rewards of the Investment prior to Investing on the Same” යනුවෙන් සඳහන් කරමින් අවදානම සහ ප්‍රතිලාභ ඇගයීම ආයෝජනයට පෙර සමිතියේ වගකීමක් වන බව නිශ්චිතව ප්‍රකාශ කර ඇත.

මේ අනුව භාර ලියවිලි මත කෙරෙන ආයෝජනයන් පරිනත වූ අවස්ථා වලදී අදාල මූල්‍ය ආයතන විසින් මුල් මුදල සහ පොළිය ගෙවීම පැහැර හැරිය හොත් එම මුදල් ආයෝජන බැංකුකරු විසින් භාර ලියවිලි අනුව සමිති සංගම් වෙත ගෙවීම නොකරන හෙයින් සමිති සහ සංගම්වල තම ඉතුරුම් තැන්පත් කර ඇති සාමාජික සහ සාමාජික නොවන ප්‍රජාවගේ තැන්පත්

මුදල් ආපසු ලබාගැනීමට නොහැකි වුවහොත් නෛතික අවදානම සහ ප්‍රතිරූපීය අවදානම ඇතිවන අතර මෙම තත්ත්වය තුලින් පොදුවේ සමුපකාර මූල්‍ය සේවා සමිති හා සම්බන්ධිත ප්‍රජාව අතර පවත්නා යහපත් ප්‍රතිරූපයටද හානිකර වේ.

**03. වහාම ගත යුතු ක්‍රියාමාර්ග**

I. ආයෝජන බැංකුකරුවන් විසින් නිකුත් කරනු ලබන භාර ලියවිලි මත තැන්පත්කරුවන්ගේ අරමුදල් ආයෝජනය කිරීම දැඩි අවදානම් සහිත හෙයින් වහාම බලපැවැත්වෙන පරිදි එම ආයෝජනයන් සිදු නොකල යුතු වේ.

II. මේ දක්වා කර ඇති ආයෝජනයන් කල් පිරීමේදී පොලිය සමඟ ආපසු ලබාගත යුතුය.

III. මූල්‍ය සේවා සමුපකාර සමිති/සංගම්වල වත්කම් සහ වගකීම් කමිටු (ALCO) සාමාජිකයන්,අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්,ප්‍රධාන ගණකාධිකාරී,සාමාන්‍යාධිකාරී,ප්‍රධාන අභ්‍යන්තර විගණක ආදී නිළධාරීන් මෙවැනි මූල්‍ය සමාගම්වල දැනටමත් භාර ලියවිලි මත කර ඇති ආයෝජනයන්ට අදාල භාර ගිවිසුම් පරීක්ෂා කර ඒවා ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඇත්නම් සිංහල/දෙමළ භාෂාවෙන් ලබාගත යුතු අතර, ආදාල තැන්පතු භාරගත් මූල්‍ය සමාගම සමිතිය විසින් තැන්පත් කරන ලද මුදල් නොගෙවන අවස්ථා වලදී එම ආයෝජන බැංකුකරු එම තැන්පතුව ආපසු ගෙවීමට කටයුතු කරන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කර තහවුරු කරගත යුතුය. තවද ඉහත අංක (2.II) යටතේ සඳහන් ආකාරයේ කොන්දේසි ඇත්නම් එම තත්ත්වය මනාව අවබෝධ කර ගැනීමෙන් ආයෝජනයන් සිදු කිරීමෙන් වැළකී සිටිය යුතුය.

මෙම චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කිසියම් මූල්‍ය සේවා සමුපකාර සමිතියක් හෝ සංගමයක් භාර ලියවිලි මත මුදල් ආයෝජනය සිදුකර පරිණතියේදී ආපසු ලබා ගැනීමට නොහැකි වීම මත ඇතිවන යම්කිසි අලාභයකට හෝ පීඩාවකට හෝ සමිතිය යටත්වන යම් දඩුවමකට 1973 සමුපකාර රීති 26 වගන්ති අනුව අධ්‍යක්ෂකවරුන් පෞද්ගලිකව සහ සාමූහිකව වගකීමට බැඳෙන බවද කාරුණිකව සිහිපත් කරමි.

ඩී.ජීවනාදන්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

| | | |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂක ජනරාල් ( ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ) | - කරු.දැ.පි |
| 2. | දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන් | - කරු.දැ.පි හා අ.ක.ස |
| 3. | සමුපකාර සමිති අධීක්ෂණ නිලධාරීන් | - කරු.දැ.පි හා අධීක්ෂණ කටයුතුවල දී අවදානය යොමු කිරීම සඳහා |
| 4. | විගණන නිලධාරීන් | - කරු.දැ.පි හා වාර්ෂික විගණනයේදි අවධානය යොමුකිරීම සඳහා |